# උපදෙස්

1. මෙම අයදුම් පත්‍රය පිරවීමට පෙර උපදෙස් කියවා බලා යම් අපැහැදිලි හෝ වෙනත් අදාල තොරතුරු අවශ්‍ය වේ නම් සභාවේ සැලසුම් නිලධාරින් හමුවී උපදෙස් ලබාගත හැකිය.
2. ගොඩනැගිලි සැලසුම් පිළියෙල කිරීමේදී පහත සඳහන් අවශ්‍යතා ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය.
   - i පරිමාණුකූලව තිබීම 1:8
   - ii උතුරු දිසාව නිවැරදිව දක්වා තිබීම.
   - iii ගොබිම සැලැස්ම පරිමාණයට තිබීම
   - iv අත්තිවාරම පිළිබඳ විස්තරය
   - v අදාල ඉඩමට ප්‍රවේශ වන ආකාරය දක්වා තිබීම(ප්‍රධාන මාර්ගයේ නම සහ පළල)
   - vi ප්‍රධාන මාර්ගයෙන් ඉඩමට ප්‍රවේශකත්වය පෞද්ගලික මාර්ගයකින් ලබාගන්නේ නම් ගොඩනැගිල්ලේ උප කොටස්වල ඇතුලත දිග හා පළල හා ගොඩනැගිල්ලේ පියස්සේ පහල කෙළවර උස හා වහලට ඇති උස දක්වා තිබීම.
   - vii ගොඩනැගිල්ල අදාල බිමේ පිහිටුවන ආකාරය හා මායිම්වල සිට ගොඩනැගිල්ලට ඇති දුර සඳහන් කර තිබීම.
   - viii වැසිකිළිය සහ ළිඳ පැහැදිලිව දක්වා තිබිය යුතුය.(පරතරය අඩි 35 නොඅඩු විය යුතුය.)
3. ගොඩනැගිලි අයදුම් පත්‍රය සමග අවසර ලත් මිනුම්දෝරුවෙකු විසින් පිළියෙල කරන ලද මිනුම්දෝරු සැලැස්ම හා එහි පිටපතක් ඉදිරිපත් කලයුතු අතර එය නගර සභාව මගින් අනුමත කරවා ගත යුතුය. (මෙය බිම් සැලැස්ම සමග සසැඳිය යුතුය.)
4. මනුෂ්‍ය වාසය සඳහා අදහස් කරන සෑම ගොඩනැගිල්ලකටම අයත් වූ වැසිකිළියක් තිබිය යුතුමය. එම වැසිකිළිය සැලැස්මේ දක්විය යුතුය. නැතහොත් ගොඩනැගිල්ල තැනීමට අවසර දෙනු නොලැබේ.
5. වාසය සඳහා යෙදෙන කාමරයක බිම ඉඩකඩ පහත සඳහන් පරිදි විය යුතුය.
   - i ප්‍රථම කාමරය වර්ග අඩි 120 නොඅඩු විය යුතුය.
   - ii ද්විතීය කාමරය වර්ග අඩි 100 කට නොඅඩු විය යුතුය.
   - iii අනිකුත් අතිරේක කාමර සියල්ලක්ම වර්ග අඩි 90 ට නොඅඩු විය යුතුය.
6. යෝජිත ගොඩනැගිල්ලේ නීත්‍යානුකූල ආලෝක වාතාශ්‍ර ලබාගැනීමට ජනේල සවිකිරීමට අදහස් කරන්නේ නම්, එම ජනේල සවිකිරීමට අදහස් කරන බිත්තිවල සිට ඉඩමේ මායිම් වලට අඩුවශයෙන් අඩි 7 1/2 ක් විය යුතුය.
7. නේවාසික කටයුතු හා (වාණිජ, කර්මාන්ත, ගබඩා) අනෙක් භාවිතා සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිලි වල ඇති සෑම ව: අ: 2000 කටම වාහන නවතා තැබීම සඳහා ඉඩ කඩ අදාල ඉඩමෙන්ම වෙන්කර තැබිය යුතුය. එසේ නොකරන්නේ නම් රු: 15000/- බැගින් රථවාහන නවතා තැබීමේ ඉඩකඩ නොසැපයීම වෙනුවෙන් විශේෂ ගාස්තුවක් ගෙවිය යුතුය. (මෙය පොදු රථ ගාලක් ඇතිකිරීම සඳහා වන අරමුදලට බැර කරනු ලැබේ).

අවවාදයයි

1. අවසර පත්‍රයක් නොලබා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ඉදිකිරීම් වලට අදාලව කිසිම කටයුත්තක් නොකළ යුතුයි. එසේ කළහොත් අනවසර ඉදිකිරීම් ලෙස සළකා නීති මගින් කටයුතු කරනවා ඇත.
2. අනුකූලතා සහතිකය නොලබා යම් ගොඩනැගිල්ලක පදිංචිවීම හෝ ප්‍රයෝජනයට ගැනීම තහනම්ය. එය කඩ කරන අයට දිනකට රු:25/- ක දඩ මුදලක් ගෙවීමට සිදුවනු ඇත.
3. ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අනුමැතිය දී ඇති වලංගු කාලය අවුරුදු එකකට සීමාවන අතර එම කාලය ඉකුත් වීමට ප්‍රථම රු 20/- ක මුදලක් ගෙවා වලංගු කාලය දීර්ඝ කරවා ගත යුතුය.
4. ගොඩනැගිල්ලක් අලුතින් තැනීම/ නැවත ඉදිකිරීම/ වෙනස් කිරීම/ අනුමත කරන ලද සැලැස්ම වෙනස් කිරීම නීති විරෝධී ක්‍රියාවකි. අනුමත කරන ලද සැලැස්මට වෙනස්ව ගොඩනැගිල්ල තැනීම අවශ්‍ය වේ නම් ඒ සඳහා සංශෝධිත සැලැස්මක් නොපමාව ඉදිරිපත් කළ යුතුය. එම සංශෝධිත සැලැස්මක් නාගරික කොමසාරිස් විසින් අනුමත කරන තෙක් ගොඩනැගිල්ල තැනීමේ කටයුතු ඇරඹීම නොකළ යුතුය.

## 1 වන කොටස

| ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය | නේවාසික ගොඩනැගිලි සඳහා | වෙළඳ ඇතුළු අනෙකුත් සැම ගොඩනැගිලි සඳහා |
|---|---|---|
| 1-500 | රු 100.00 | රු 200.00 |
| 501-1000 | රු 150.00 | රු 300.00 |
| 1001-2000 | රු 250.00 | රු 500.00 |
| 2001-3000 | රු 500.00 | රු 2000.00 |
| 3001-4000 | රු 1000.00 | රු 3000.00 |
| 4001-5000 | රු 1500.00 | රු 4000.00 |
| 5001-7500 | රු 2500.00 | රු 6000.00 |
| 7501-10000 | රු 5000.00 | රු 10000.00 |

වර්ග අඩි 10000 කට වැඩි සෑම වර්ග අඩි 1000 කටම රු 150/- බැගින් ගෙවිය යුතුය.

### පිටුපස විවෘත ප්‍රදේශය

| මහල් ගණන | පිටුපස ඉඩමේ මායිමේ සිට තිබිය යුතු විවෘත ප්‍රදේශය |
|---|---|
| බිම් මහල | අඩි 7 අඟල් 6 |
| 2 සිට 4 දක්වා | අඩි 10 අඟල් 0 |
| 4 ට වැඩි | ගොඩනැගිල්ලේ උසින් 50% (අඩක්) |

### ප්‍රවේශකත්වය

| බිම් කට්ටි ගණන | මාර්ගයේ පළල |
|---|---|
| 1 සිට 8 | අඩි 10 |
| 5 සිට 8 | අඩි 15 |
| 9 සිට 20 | අඩි 20 |
| 20 ට වැඩි | අඩි 30 |

ලියා පදිංචි කිරීමේ ගාස්තු :- රු ..............................  අංකය ..............................

.............................................................  යොමු අංකය ..............................

# මොරටුව මහා නගර සභාව

අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරයේ සැලසුම් හා ගොඩනැගිලි නීතිරීති සංග්‍රහය අනුව

**ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අයදුම් පත්‍රය**

පහත අත්සන් කරන .............................................................................................. වන.

(සම්පූර්ණ නම)

අංක ..............................................................................................

(තැපැල් ලිපිනය)

.............................. පාරේ පදිංචි මා පූර්වෝක්ත පනතේ සියලු විධි විධාන ප්‍රකාර හා මේ සමග ඇති ගොඩනැගිලි සැලසුම් හා සටහන් සහ විශේෂ විස්තර වලට හා ඒවායේ දක්වා ඇති ප්‍රමාණ වලට ද අනුකූලව මොරටුව අංක .............................. දරණ කොට්ඨාශයේ .............................................................. / පාරේ වරිපනම් අංක .............................. දරණ ස්ථානයේ පිහිටි .............................................................. නැමැති ඉඩමේ .............................................................. තනා ගැනීම / වෙනස් කිරීම සඳහා මවිසින් අත්සන් කරන ලදුව මේ සමග අමුණා ඇති පිටපත් තුනකින් සමන්විත ගොඩනැගිලි සැලසුම් හා සටහන් සහ විශේෂ විස්තර ලියවිල්ලකින් අනුමත කර දෙන ලෙස මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගෙන් ඉල්ලා සිටිමි.

(නිවැරදි වරිපනම් අංකය හා දේපල පිහිටි ස්ථානය පැහැදිලිව සටහන් කළ යුතුය.)

දුරකථන අංකය ..............................

..............................

අයදුම්කරුගේ අත්සන

අයදුම්කරුගේ නම සහ තැපැල් ලිපිනය : ..............................................................

..............................................................

(අයදුම්කරු ඉඩමේ අයිතිකරු නොවේ නම් පහත ඡේදය සම්පූර්ණ කළ යුතුය.)

ඉහත අත්සන් කර ඇති ..............................................................

නැමැති අයට මෙම ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදි කිරීමට බලය පවරන ලද බව සහතික කරමි.

1. ඉඩම අයිතිකරුගේ අත්සන :- ..............................
2. ඉඩම අයිතිකරුගේ නම :- ..............................
3. ලිපිනය : ..............................

(අනවශ්‍ය වචන කපා හරින්න)